# 5. පික්හුල් මාලිය්යාත්

## 5.1 ඉපයීම හා වෘත්තියේ වැදගත්කම

"ඔහු (අල්ලාහ්) ඔබට මෙම මිහිතලය මවා විහිදා පැතිරෙව්වේය. එහි නන් දෙසට ගොස් ඔහු ඔබට පුදකල දායාදයන් භුක්ති විඳින්න" (67:15)

මිනිසා ජීවත්වීම හා පැවැත්ම උදෙසා වස්තූන් සොයා ගැනීම හෝ ඉපැයීම ඔහුගේ ජීවිතයේ ප්‍රධාන තැනක් ගනී. මෙලොවෙහි සම්පත් නැතුව කිසිවෙකුටත් ජීවත්විය නොහැකිය. අල්ලාහ් මෙම මිහිතලය විහිදුවා එහි මිනිසාට අවශ්‍ය නොයෙකුත් සම්පත් වලින් පුරවා තැබුවේය. සමහර දෑ මිනිසා නොමිලේ ලබා ගන්නේය. තවත් සමහර දෑ ඔහු උත්සහයෙන් හා තමාගේ හැකියාවෙන් නිෂ්පාදනය කර ලබා ගනියි. අල්ලාහ් ඔහුගේ මතය පරිදි එසේ ලෝකය සකසා ඇත්තේය.

ධනය රැස්කර ගැනීම සඳහා යම් කෙනෙකු ඉපැයිය යුතුය. ඉපැයීමේ වැදගත්කම අල්ලාහ් හා ඔහුගේ රසූල්වරයා අපට පෙන්වා දී ඇත. කිසියම් රැකියාවක් නොකර අන් අයගෙන් යැපී ජීවත් වීම ඉස්ලාමය අනුමත නොකරයි. යම් කෙනෙකු තමා තුල ගැබ් වී ඇති හැකියාවන් ප්‍රයෝජනයට ගෙන උපරිම ඵල නෙලා ගනිමින් ඉපැයීමෙහි යෙදිය යුතු යැයි ඉස්ලාම් දහම අවධාරණය කර සිටියි.

ඉපැයීම සඳහා නිවසින් පිටත්ව යන්නන්ව ශුද්ධ වූ යුද්ධයට සමඟ සංසඳනය කොට ඉස්ලාම් ධර්මය පවසා ඇත.

### නබිවරුන්ගේ මඟ පෙන්වීම

ජනතාවට නිසි මග පෙන්වීම සඳහා පැමිණි සියලු නබිවරුන් තම තමන්ගේ ජීවනෝපාය රැක ගැනීම සඳහා කිසියම් රැකියාවක නිරත වී සිටියහ.

1. ආදම් (අලෛ) තුමා කෘෂිකාර්මිකයෙකු වශයෙන්ද,
2. දාවූද් (අලෛ) තුමා ලෝහ කර්මාන්තයෙහිද,
3. නූහ් (අලෛ) තුමා වඩු කාර්මිකයෙකු වශයෙන්ද,
4. ඉද්රීස් (අලෛ) තුමා මැහුම් ශිල්පියෙකු වශයෙන්ද,
5. මූසා (අලෛ) තුමා ගොපලෙකු වශයෙන්ද,
6. රසූල් (සල්) තුමාණන් එළුවන් රැකබලා ගන්නෙකු හා ව්‍යාපාරිකයෙකු වශයෙන්ද එක් එක් වෘත්තියෙහි යෙදී ජීවිකාව රැක ගත්හ.

### රසූල් (සල්) තුමාණන්ගේ මඟ පෙන්වීම

මුහම්මද් නබි (සල්) තුමාණන්, තමාගේ කුඩා කල සිටම අන් අයට බරක් නොවී ජීවත්වීමට හුරුපුරුදු වී සිටියහ. හලීමා මව්තුමිය භාරව සිටින කාලයේ ඇයගේ එළුවන් රැකබලා ගනිමින් ඇයට සහය වූහ. බාප්පාගේ භාරයේ සිටින වකවානුවේ, ඔහුගේ ව්‍යාපාර කටයුතුවලට සහාය දෙමින්ද, තරුණ කාලයේ කදීජා මව්තුමියගේ ව්‍යාපාර කටයුතුවලට සහාය ලබා දීමෙන් ද කිසියම් රැකියාවක යෙදී තම උම්මතයට නිසි මඟ පෙන්වා දුන්හ.

"යම් කෙනෙකු තමාගේ දෑතින් උපයා සකසා ගන්නා ආහාරය වෙන කිසිම ආහාරයකට දෙවෙනි වන්නේ නැත." (බුහාරී)

වරෙක එක්තරා මිනිසෙකු නබි (සල්) තුමාණන් වෙතට පැමිණියේය. තමාට යම්කිසි දෙයක් දෙන ලෙස ඉල්ලා සිටියේය. මෙයට සවන්දුන් නබි (සල්) තුමාණන් "ඔබේ නිවසෙහි කිසිවක් තිබේදැ,යි" ප්‍රශ්න කළහ. පොරවනයක් හා භාජනයක් පමණක් ඇතැයි පිළිතුරු දුන්නේය. ඒවා රැගෙන එන ලෙස ඔහුට නබි (සල්) තුමාණන් අණ කළහ. එකී භාණ්ඩ නබි (සල්) තුමා වෙත රැගෙන එන ලදී. නබි (සල්) තුමා වෙත රැගෙන එන ලදී. නබි (සල්) තුමාණන් එකී භාණ්ඩ වෙන්දේසියේ විකුණා දිර්හම් දෙකක් ලබා දී මෙසේ පැවසූහ. "මෙම මුදල් වලින් දිර්හමකට කෑම මිලදී ගෙන බිරිඳට දෙන්න. අනිත් දිර්හමෙන් පොරවක් මිලදී ගන්න" යැයි කියා එම මිනිසාව පිටත්කර යැවූහ. පොරොව ගෙනෙන ලදින්, තම දෑතින්ම නබි (සල්) තුමාණන් එයට මිටක් සවිකර එම මිනිසා වෙත බාර දී "ඔබ දර කපා විකුණා ජිවත්වන්න" යැයි කියා ඔහුව යැවූහ.

එකී මිනිසා නබි (සල්) තුමාණන් කී පරිදි දර කපා ජිවත්වූයේ ය. දින පහළොවකට පසු නබි (සල්) තුමාණන් මුණගැසීමට පැමිණියේය. ඔහු සිය නව රැකියාවෙන් උපයන ආදායම ගැන නබි (සල්) තුමාණන්ට පවසා සිටියේ ය. නබි (සල්) තුමාණන්ට තුති පුද කළේය. එවිට නබි (සල්) තුමාණන් "අනුන්ට අත පා ජිවත්වීමෙන් පරමාන්තයේ මුහුණේ කළු පැල්ලම් සහිතව පැමිණෙනවාට වඩා මෙම වෘත්තිය ඔබට ඉතා උසස් එකකි" (තිර්මිදි) යනුවෙන් අනුශාසනා කර ඔහුව පිටත්කර යැවූහ.

තවත් වරෙක තම ශ්‍රමයෙන් හරි හම්බ කර දෑතේ කරගැට මතුවී තිබුණු කම්කරුවෙකුගේ දෑත අල්ලාගත් නබි (සල්) තුමාණන් බොහෝ වේලාවක් ඔහුගේ අත අල්ලා ගෙන සිටියහ. එය බලා සිටින්නන් මේ දැක විමතියට පත් වූ විට එම ශ්‍රමිකයාව ඉතා උසස් කොට මෙසේ කතා කළහ "සත්‍ය වශයෙන්ම අල්ලාහ් රැකියාවක නිරත විශ්වාසවන්තයාට සෙනෙහස දක්වයි" (තබරානි)

"කිසිවකු හලාල් වූ රැකියාවක නිරත වී සිට විඩාවට පත්ව රැයක් ගත කරන්නේද ඔහු ඔහුගේ පව්වලට සමාව ලද අයෙකු වශයෙන් එම රැය ගත කරන්නේය" (ඉබුනු අසාකිර්)
"කෙනෙකු තම දෑතින් උපයා එමඟින් ලබා ගන්නා ආහාරය ඉතාමත් අගනා බවත්, කම්කරුවකුගේ දහඩිය වේළි යන්නට පෙර ඔහුගේ වැඩ කුලිය දිය යුතු බවත්" නබි (සල්) තුමාණන් අපට දේශනා කර ඇත.

## සහාබාවරුන්ගේ ජීවිතයෙන්

මක්කාවේ සිට මදිනාවට හිජ්රත් ගිය සමහර සහාබාවරුන්, මදිනාවේ ජිවත්වන අන්සාරිවරුන්ගේ උදව් උපකාර ලබා ගැනීම ප්‍රතික්ෂේප කළ අතර ඔවුන්ට මදිනාවෙහි වෙළඳපොල පෙන්වා දෙන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.

අරා ඉබුනු මාලික් (රලි) නම් සහාබිවරයා, ජුම්ආ මෙහෙය නිමවා මස්ජිදයේ මිදුලට පැමිණ මෙසේ ප්‍රාර්ථනා කළේ ය. "යා අල්ලාහ් ! නුඹගේ ඉල්ලීමට සවන් දුනිමි. නුඹ විසින් අනිවාර්ය කරන ලද යුතුකම ඉටු කළෙමි. නුඹගේ අණ පරිදි මේ මිහිතලයේ නන් දෙසටම පැතිර යමි. නුඹගේ දායාදයන් මට ලබාදෙත්වා. නුඹ දායාද කරන්නන් අතරින් ශ්‍රේෂ්ඨවන්තයාය"

කිසිම රැකියාවක හෝ වෘත්තියක නිරත නොවී මස්ජිදයේ නිකරුණේ රැඳි සිටි පිරිසක් දෙස බලා "ඔබලාගෙන් කිසි කෙනෙකු රැකියාවක නොයෙදී සිටින්නට එපා. අල්ලාහ් අපට ආහාර ලබා දෙත්වා යයි ප්‍රාර්ථනා කිරීම පමණක් සිටීම නොසෑහෙන බවත් අහසෙන් ඉබේ රත්තරන් හෝ රිදී පහළ නොහෙළයි යනුවෙන් උමර් (රලි) තුමා අවවාද කර සිටියහ.

තවද එතුමා මෙසේ ද ප්‍රකාශ කර සිටියහ.

"ශුද්ධ වූ යුද්ධයේ යෙදී සිටින විටදී හෝ අල්ලාහ්ගේ දායාදයන් සොයමින් සිටින විටදී මාගේ මරණය සිද්ධ විය යුතු යැයි මම පතමි."

අපි ඉහත සඳහන් කුර්ආනයේ, සුන්නාහ් වේ, නබිවරුන්ගේ මග පෙන්වීමෙන් හා ක්‍රියාවලියෙන් කිසියම් වෘත්තියක නිරත වීම අනිවාර්ය හා වැදගත් යැයිද එය අල්ලාහ්ගේ ආදරයට පාත්‍ර වූ කරුණක් යැයිද වටහා ගතිමු.

කිසිම රැකියාවක් පහත් කොට නොසැලකිය යුතු අතර කිසිම රැකියාවක නොයෙදී සිටීම ඉතාමත් පහත් වූ තත්වයකි. සමහරු කෘෂි කර්මාන්තයෙහි යෙදෙති. තව කොටසක් නොයෙකුත් කර්මාන්තවලද, තව සමහරුන් ව්‍යාපාර කටයුතු වලද යෙදෙමින් සිටිති. ගණකාධිකාරිවරුන්, ඉංජිනේරුවරුන්, වෛද්‍යවරුන් වැනි අය තම බුද්ධිය හා සම්බන්ධ රැකියාවල නිරත වෙති. එය අල්ලාහ් ඔවුනොවුන්ට පිරිනැමූ දායාදයන් හා හැකියාවන් අනුවය.

මුස්ලිම්වරුන් වන අපගේ ව්‍යවසායන් හා රැකියාවන් ඉස්ලාමය විසින් දේශනා කල පරිදි එයට අනුකූලව සකස් කර ගත යුතුයි. එවිට අපට අල්ලාහ්ගේ ආනිසංස ලබා ගැනීමට හැකි වනු ඇත. එපමණක් නොව අපේ උත්සහයේ වර්ධනයක් ද (බරකත්) බලාපොරොත්තු විය හැකිය. අපි අපගේ නිසි කල පැමිණි විට යම්කිසි රැකියාවක නිරත වී අන් අයට බරක් නොවී ජීවත්වීමට අදිටන් කර ගනිමු.

## සිඟමන් යැදීම

“ඔබ මිනිසුන්ගෙන් කිසිම දෙයක් සිඟමන් වශයෙන් ඉල්ලා සිටින්න එපා. ඔබ ඔබේ වාහනයේ නැගී සිටින විට ඔබගේ කසය බිම වැටුනද එය අහුලා ගැනීමට අන් අයගේ පිහිටක් නොපතන්න. ඔබ වාහනයෙන් බිමට බැස එය අහුලා ගන්න” (අහමද්)

“යම් කෙනෙකු අඛණ්ඩව සිඟමනේ යෙදී සිටියේ නම් පරලොවේදී ඔහුගේ මුහුණේ සම නොමැති තත්ත්වයක නැගිටවනු ලබයි” යයි රසූල් (සල්) තුමාණන් පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

අනවශ්‍ය ලෙස සිඟමන් යෙදීම ඉස්ලාමය දැඩි ලෙස හෙලා දකියි. දරිද්‍රතාවයෙන් මිදීමට හා ආර්ථික වශයෙන් පරිපූර්ණ වූ ජීවිතයක් ගත කිරීම සඳහා කිසියම් ශක්තිමත් වෘත්තියක නියලිය යුතු යැයි ඉස්ලාමය දේශනා කරයි.

“අන් අයගේ සිඟමන් ඉල්ලීමට වඩා, තම පිටෙහි දර මිට ඔසවා ගෙන ගොස් විකුණා ජීවත්වීම උසස් වේ, අන් අයගෙන් ඉල්ලා සිටින විට ඔහු ලබා දීමට මෙන්ම ප්‍රතික්ෂේප කිරීමටත් පුළුවන” යයි රසූල් (සල්) තුමාණන් වරෙක පවසා සිටියහ. (බුහාරි)

ඉපැයීමෙහි යෙදෙන්නා සමාජයේ ගෞරවාන්විතව ජීවත්වෙයි. සිඟමනේ යෙදෙන්නා තමාගේ ආත්ම ගරුත්වය හා චරිතයද නැති කරගන්නා තත්ත්වයකට පත්වෙයි. අල්ලාහ් අපට ලබා දුන් දායාදයන් ප්‍රයෝජනයට ගනිමින් උපයා ජීවත් වීම මුස්ලිම්වරයෙකුගේ ගුණයකි.

“ඔබෙන් පසුව ඔබගේ දූ දරුවන් අනුන්හට අත් නොපා ජීවත්වීමට මං සලසා දී ඔවුන්ට වඩා හොඳ අනාගතයකට මග පාදා මියයෑම ඉතා අගනේය”

<u>අභ්‍යාසය</u>

(1) පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. අනාගතයේ ඔබ යෙදෙන්නට බලාපොරොත්තු වන රැකියාවක් නම් කර එය ඔබ ඉස්ලාමීය රාමුවක් තුළ සකසා ගන්නේ කෙසේද යනුවෙන් පහදන්න.

II. "මුස්ලිම්වරයෙකු උපයා ජීවත්වීම වැදගත්" පැහැදිලි කරන්න.

III. ඉපැයීමේ වැදගත්කම විදහා දක්වන කුර්ආන් අයත් දෙකක් හා හදිස් දෙකක් සඳහන් කරන්න.

IV. හිඟාමනේ යැදීම ඉස්ලාම් හෙලා දකින්නේ කෙසේද යයි පැහැදිලි කරන්න.

## 5.2 වෙළෙඳාමෙහි ක්‍රමවිධි හා තහනම් වූ දෙවල්

පොදුවේ ගත්කළ වෙළෙඳාම යනු භාණ්ඩ හුවමාරුව යන්න භාවිතා කළද, භාණ්ඩයක උරුමය යම් දෙයක් ආදේශණයක් වශයෙන් ලබාගෙන එකී ද්‍රව්‍යයේ හෝ භාණ්ඩයේ උරුමය සෙස්සෙකු වෙතට පැවරීමේ ක්‍රියාව වෙළෙඳාම නම් වේ. වෙළෙඳාම ඉස්ලාම් ධර්මය බොහෝ සේ සංවාදයට ලක්වූ කරුණකි. එලෙසම දෙවියන්ගේ දයාදයන් සොයා ගැනීමට වෙර දරණ ක්‍රියාවක් වශයෙන් ද වෙළෙඳාම විග්‍රහ කර ඇත.

### වෙළෙඳාමෙහි හා වෙළෙන්දාගේ වැදගත්කම

"අවංක හා සත්‍යවාදි වූ වෙළෙන්දෙකු පරලොවෙහි නබිවරුන්, සිද්දීක්වරුන් (සත්‍යවාදීන්) හා ෂුහදාවරුන් (ජිහාදයේ දී ෂහීවූවන්) සමඟ සිටියි" (අහ්මද්)

"(ජුම්ආ) සලාතය අවසන් වූ විගස මිහිපිට විසිරී ගොස් අල්ලාහ්ගේ දායාදයන් සොයා ලැබ ගන්න"
(62 : 10)
(අල් කුර්ආන්)

"දෙවියන්ගේ දායාදයන් සොයා ගැනීම සඳහා නැව්, සයුර පරයමින් යනු ඔබ දකින්නේ ද එයට අල්ලාහ්ට ස්තුති වන්ත වන්න" (35 : 12)

වෙළෙන්දාගේ හෝ වෙළඳාමෙහි වැදගත්කම් ඉහත සඳහන් අල් කුර්ආන් වාක්‍යවලින් මනාව පැහැදිලි වේ. අප සමාජයේ බොහෝ දෙනා නොයෙකුත් වෙළෙඳාමෙහි නිරත වී සිටිය ද ගණුදෙනු වල නීති රීති දැන සිටින්නේ ඔවුන්ගෙන් කිහිප දෙනෙකු පමනි. වෙළෙඳාමෙහි නීති රීති සුරැකීම අනිවාර්ය වගකීමකි. එවිට අපේ ක්‍රියාවන් අල්ලාහ්ගේ තෘප්තියට හේතු වී අපට කුසල් ලබා ගත හැකිවේ. එසේ නොමැති විට අපගේ කටයුතු හරාම් තත්ත්වයට පත්වී ඔහුගේ ශාපයටත් කෝපයටත් භාජනය වීමට ඉඩ ඇත.

උමර් (රලි) තුමන් වරින් වර වෙළෙඳපොලට පැමිණ තමාගේ කසයෙන් සමහර වෙළෙඳුන්ට පහර දී මෙසේ පැවසුහ. "ව්‍යාපාර නීති රීති නොදත් අය අප වෙළෙඳපොලෙහි ව්‍යාපාර කටයුතුවල නිරතවන්න එපා ! ඒ මක්නිසාද යත්, ඔවුන් දැනුවත් ව හෝ නොදැනුවත්ව හරාම් (පොලිය) අනුභව කිරීමට සිදුවීම නිසාය."

### වෙළෙඳාමේ වැදගත් අංග

වෙළෙඳාම සඳහා මූලික කරුණු තුනක් අවශ්‍ය වේ. ඒවා නම් :

1. ගැණුම්කරු - විකුණුම්කරු

2. වෙළෙඳ භාණ්ඩය

3. ඊජාබ් - කබූල් (බාරදීම හා බාරගැනීම)

## ගැණුම්කරු හා විකුණුම්කරු

බිමත්ව හෝ මත්වී සිටින්නන් හෝ,
සිහි බුද්ධියෙන් තොර වුවන් හෝ,
මන්ද බුද්ධිකයන් හෝ,
අත්තම්යිස් (වැඩිවියට) පත් නොවූ දරුවන් හෝ,

නොවිය යුතුය. මොවුන්ට ව්‍යාපාර ගණුදෙනු වලට සහභාගිවීමට අවසරයක් නැත. මෙවන් අය සමඟ කරන ගණුදෙනු ඉස්ලාමීය දෘෂ්ඨිකෝණයෙන් බලන කල නිෂ්ප්‍රභා කළ යුත්තකි.

## වෙළෙඳ භාණ්ඩ

ඉස්ලාමීය ෂරීඅත් ප්‍රකාර වෙළඳ භාණ්ඩ ප්‍රයෝජනවත් හා පිරිසිදු බවින් යුක්ත විය යුතුයි. භාණ්ඩය විකුණුම්කරු සතුවද, ගැණුම්කරුට භාරදිය හැකි තත්ත්වයකද තිබිය යුතුයි. මිලද සඳහන් කර තිබිය යුතුයි.

මේ අනුව, පහත සඳහන් දේවල් තහනම් කර ඇත.

### නජිස් ද්‍රව්‍ය
නිද : මත්ද්‍රව්‍ය, ඌරන්

මත්ද්‍රව්‍ය පෙරන්නා, විකුණන්නා, ඊට සහය දෙන්නා යනාදී සියලු දෙනා දෙවියන්ගේ කෝපයටත්, ශාපයටත් පාත්‍ර වුවන්ය. අප යොවුන් පරපුර මෑත යුගයේ සිට මත්ද්‍රව්‍යවලට නැඹුරුවූ තත්ත්වයක් දක්නට ලැබේ. එම තත්ත්වයෙන් මිදී ජීවත්වීමට අපේ තරුණ පරපුර වග බලා ගත යුතුයි.

### නිෂ්ඵල ද්‍රව්‍ය

ගැණුම්කරුට හෝ විකුණුම්කරුට කිසිම ප්‍රයෝජනයක් ගෙන නොදෙන භාණ්ඩ
නිද : සමහර කෘමින්, නිෂ්ඵල අපද්‍රව්‍ය,

### අනුන්ට අයිති ද්‍රව්‍ය

තමාට අයිති නොවන දෙයක් විකිණීම තහනම් කර ඇත.
නිද : රජය සතු දේපල

### ගැණුම්කරුට භාරදිය නොහැකි භාණ්ඩ
නිද : මුහුදේ සිටින මාළු

### අත්පිට නොමැති භාණ්ඩ
නිද : නැවෙහි ගෙනෙමින් තිබෙන භාණ්ඩ

### වෙළෙඳ භාණ්ඩ හෝ නියම වශයෙන් සඳහන් නොවන භාණ්ඩ
යනාදිය අලෙවි කිරීම ඉස්ලාම් තහනම් කර ඇත. නමුදු සමහර ද්‍රව්‍යයන් පියවී දෑසට නොපෙනෙන තත්ත්වයේ ඇත. නිදසුනක් වශයෙන් සිලින්ඩර් ගත වායු, ටින්කිරි, ටින්මාළු යනාදියෙහි ස්වභාවය හා ලක්ෂණ තහවුරු වී ඇති අවස්ථාවල අලෙවි කිරීම තහනම් නොවේ.

## ඊජාබ් - කබූල්

"ඊජාබ්" යනු විකුණුම්කරු තමා නිශ්චිත භාණ්ඩය, අලෙවි කල බවටත් "කබූල්" යනු ගැණුම්කරු එය මිලදී ගත් බවටත් හෙලි කරන ප්‍රකාශයයි. මෙය වාචිකව, ලිඛිතව හෝ වෙනත් යම් ප්‍රායෝගික වූ ක්‍රමයකින් විය හැකිය.

## වෙළෙඳ ගණුදෙනුවල තහනම් කරනු ලැබූ කටයුතු

**අනවශ්‍ය දිවිරීම්**

**අනවශ්‍ය (බොරු) දිවිරීම, මෙලොවෙහි මිනිසාව පවට තල්ලු කරනවා සේම පරමාන්තයේ නිරයේ** වේදනා විඳීමටත් හේතුවේ.

**කිරුම් මිණුම් වල වංචා කිරීම**

"වංචා කරන තැනැත්තා අප සමාජයක කෙනෙකු නොවේ."

**සඟවා තැබීම් (මිල වැඩිකර විකිණීම සඳහා)**

පව්කාරයෙකු විනා වෙන කවුරුත් හෝ සඟවා තබා භාණ්ඩ වැඩි මිලට නොවිකුණයි ජනතාවට ඇතිවී තිබෙන අවශ්‍යතාවය හෝ භාණ්ඩ හිඟය පදනම් කරගෙන වැඩි මිලට විකිණීම සඳහා බඩු සඟවා තැබීම ඉස්ලාම් තරයේ හෙළා දකියි.

බොරු කිම හා සොරකම් කරන ලද දේ මිලදී ගෙන විකිණීම. පැහැරගනු ලැබූ දේ විකිණීම යනාදියද ඉස්ලාම් තහනම් කර ඇත.

## පොලිය

පොලිය සම්බන්ධයෙන් තරමක් පුළුල්ව සලකා බැලිය යුතුයි. වර්තමානයේ පොලිය වෙළෙඳාම හා එක්ව තිබෙන තත්ත්වයක් දැන ගත හැකි වී ඇත. ඉස්ලාම් පහළ වූ අවස්ථාවෙහිද මුස්ලිම්වරු වෙළෙඳාම හා පොලිය එකක් සේ සලකා වෙළෙඳාමෙහි යෙදුනාහ. මෙය තහනම් කර අල් කුර්ආන් ආයත් මෙසේ පහළ විය.

"අල්ලාහ් වෙළෙඳාම හලාල් කර පොලිය තහනම් කළේය." (2 : 275)

"විශ්වාසවන්තයිනි, (දෙන ලද දෙයට වැඩියෙන් හා පොලියට පොලිය වශයෙන්) දෙගුණ කර ගෙන කිහිප ගුණයකට පත්කර ගත් තත්ත්වයකින් පොලිය නොබුදින්න. තවද අල්ලාහ්ට බිය බැති වන්න. ඔබට ජය ලැබිය හැකිය." (3 : 130)

කුර්ආන් වාක්‍යයන් පොලි ගන්නා තැනැත්තා තහනම් කළ සේම හදීස් ද පොලිය ගැරහුමට ලක් කර ඇත. "පොලිය දෙන්නා, පොලි ගන්නා තැනැත්තා, එය ලියාගන්නා, ඊට සාක්ෂි කාරයන් වන දෙදෙනා යන සියලු දෙනාම පාපයෙන් එක හා සමාන වුවන් වන්නේය" යැයි රසූල් (සල්) තුමාණන් පවසා ඇත්තේය. (මුස්ලිම්)

විශ්වාසවන්තයෙක් එකී කරුණු සැළකිල්ලට ගෙන පොලිය ඉවතලා කටයුතු කල යුතුයි.

## ණය ගණුදෙනු

වර්තමානයේ වෙළෙඳාමෙහි ණය නැතුවම බැරි අංගයක් වී හමාරය. මිනිසාගේ අධිකවූ ඉල්ලුම හා ආර්ථික ගැටළු මෙයට බලපා ඇත. විවිධ හේතූන් නිසා මිනිසාට නොයෙකුත් අවස්ථාවන්වල ණය වීමට සිදුවෙයි. ණය ලබා ගන්නන්, තම ණය ආපසු ගෙවීමේ චේතනාවෙන් එය ලබාතන්නේ නම් අල්ලාහ් ඔහුගේ ණය බාර ගන්නේය.

"ණයගැතියා ලබාගත් ණය පියවනතාක් ඔහු සමඟ අල්ලාහ් සිටියි." (ඉබ්නු මාජා)

ණය මගින් මිනිසාගේ ආත්ම ගරුත්වයට හානි පමුණුවනු ලබයි. රසූල් (සල්) තුමාණන් "යා අල්ලාහ් ණය බරින් හා පවෙන් මා වලකා ගනු මැනව" යනු ප්‍රාර්ථනා කළහ. මෙය ඇසූ සහාබිවරයෙකු "ඔබතුමාණන් වැඩි වැඩියෙන් ණයබරින් හා පවින් ආරක්ෂාව පතන්නේ කුමකට දැයි" ඇසීය. එවිට රසූල් (සල්) තුමාණන් "ණය ගැතියා වැඩි වැඩියෙන් බොරු කීමට පෙළඹෙයි. බොරු පොරොන්දු ලබා දෙයි. ඒ නිසා මා ඒ තත්ත්වයෙන් අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතන්නෙමි," යැයි දේශනා කළහ.

අපි, අපගේ ගණුදෙනුවලදී පොලියෙන් (ඕනෑම මුහුණුවරකින් එය තිබුණද) හා ණය බරින් වැලකී සිට අපගේ ගණුදෙනුවන් සකසා ගන්නට උත්සාහ කරමු.

<u>අභ්‍යාසය</u>

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. මුස්ලිම් ව්‍යාපාරිකයෙක් ස්වකීය ව්‍යාපාර කටයුතු ඉස්ලාමීය රාමුවක් තුල සකසා ගන්නේ කෙසේද යැයි සඳහන් කරන්න.
2. වෙළෙඳමක් සඳහා අවශ්‍ය මූලික කරුණු කුමක් ද?
3. සත්‍යවාදී හා අවංක වෙළෙන්දෙකු පරලොවෙහි කවුරුන් සමඟ නැගිටවනු ලබන්නෙහිද?
4. මුස්ලිම් ව්‍යාපාරිකයෙකු අසාධාරණ ලාභයක් ලැබිය හැකිද?

## 5.3 කෘෂිකර්මය හා කර්මාන්ත

ඉස්ලාම් ධර්මය ලොවට හඳුන්වාදෙනු ලැබූ කල සිට අනෙකුත් රැකියාවන්ට වගේම කෘෂිකර්මයට හා නොයෙකුත් කර්මාන්තයන්ටද අනුබලය ලබා දී ඇත. එලෙසම මිනිසා කෘෂිකර්මාන්තයෙහි යෙදී පොළොව සාරවත් කරන ලෙසද ඉස්ලාම් ධර්මය පවසා සිටියි. කුර්ආනය හා රසූල් (සල්) තුමාණන් නොයෙකුත් කර්මාන්ත උසස් කොට හුවා දක්වා ඇත. "සත්‍ය වශයෙන්ම දාවුද් (අලෛ) තුමා වෙත අපි, අපගේ දායාදයන් ලබා දුන්නෙමු. පර්වතයන්ට, අපි ඔහු සමඟ එක්ව යාඥා කරන ලෙස අණ කලෙමු. තවද පක්ෂීන්වද අපි ඔහුට නතු කර දුන්නෙමු. මෙලෙස ද අංග සම්පූර්ණ වූ පළිහ සාදාගන්නා ලෙසත් ඒවායේ හැඩය හා ප්‍රමාණය නියම ආකාරයෙන් සකසනු යනුවෙන් ද මිනිසුනි ! හොඳ දෙයම කරන්න මා ඔබ කරණ සියලු දෑ දෙසම බලා සිටිමි.” (සබා 10 - 11) යැයි කුර්ආනය දේශණා කරයි.

කර්මාන්ත ක්ෂෙත්‍රයේ නැතුවම බැරි අමුද්‍රව්‍යයක් බවට වර්තමානයේ, ලෝහ පත්වී හමාරය. ලෝහ ගැන අල් කුර්ආනයේ සම්පූර්ණ එක් පරිච්ඡේදයක්ම පහළ කොට එහි වැදගත්කම හා ප්‍රයෝජන ගැන සඳහන් කර, එයින් මිනිසාට බොහෝ දෑ කළ හැකි බවත්, එයින් උපරිම ඵල නෙලා ගත යුතු බවත් අල්ලාහ් ප්‍රකාශ කර සිටියි.

"තවද ලෝහය අපි ඔහුට මෘදු කොට ලබා දුන්නෙමු. දම්වැල් වැනි දෑ වක්‍රාකාරව ක්‍රමවත්ව සදාගන්නා ලෙසටද අපි අණ කෙළෙමු.” අංග සම්පූර්ණ වූ පලිහ සදා ගන්නා ලෙසත් අණ කළෙමු. (අල්-කුර්ආනය)

"වෙළෙඳාම වැදගත් වෘත්තියක් වන නමුදු, මා සිතන්නේ ඉතා හොඳ රැකියාව කෘෂිකර්මය බවය. මක්නිසාද යත්, එය තවක්කුල් හා ඉතා සමීප තත්ත්වයක් උසුලන නිසාය” යනුවෙන් ඉමාම් ෂාෆි (රහ්) තුමා පවසයි.

නොයෙකුත් කර්මාන්ත හා කෘෂිකාර්මික ක්ෂෙත්‍රයන්හි නියැලී සිටින සේවකයන්, ශ්‍රමිකයන්, කෘෂිකාර්මිකයන්, විද්වතුන්, ප්‍රවීනයන් යනාදි සියලු දෙනා ඔවුන් වෙනුවෙන් ඉපැයීමේ යෙදුනත් සිය ස්වකීය දායකත්වයෙන් නවීන විද්‍යාත්මක සොයා ගැනීම්, නවතම තාක්ෂණය හඳුන්වාදීම්, දරිද්‍රතාවය පිටුදැකිම්, යනාදි නොයෙකුත් ක්ෂෙත්‍රයන්ට දායකත්වය ලබා දෙන්නෝය. මෙමඟින් අල්ලාහ්ගේ තෘප්තිය ඔවුන් ලබා ගනිති.

**ඇගයීම් :**

"තවද, සත්‍ය වශයෙන්ම දවුද් (අලෛ) ට අප වෙතින්..........." යන තේරුම දෙන කුර්ආන් වාක්‍ය පිටපත් කරන්න. හැකිනම් එහි තේරුමද ලියා දක්වන්න.